පාසැල් සිසුවෙකු දිවි තොර කරගත් සිදුවීමක් පසුගියදා මාධ්‍ය ඔස්සේ වාර්තා වී තිබිණි. එම මාධ්‍ය වාර්තාවන් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කළ හැකි විණි.

1) දිවි තොර කරගැනීමට තැත් කළ ආකාරයද මෙහිදී ඉදිරිපත් කර ඇත. ඒ ඔස්සේද, එම ආකාරය භාවිතා කරමින් සිදුවන අනුකාරක දිවි තොර කරගැනීම් සිදුවිය හැකි බව පර්යේෂකයින් පවසයි.

2) මෙහි දිවි තොර කරගැනීමට හේතුව සරල කොට දක්වා ඇත. දිවි තොර කරගැනීමක් යනු අතිශය සංකීර්ණ කරුණක් වන අතර, ඒ පසුපස ඇත්තේ එක් සරල හේතුවක් හෝ සිදුවීමක් නොවේ.

3) මෙම පුවත සමගින් උපකාරක අංක පළ කර නැත. මෙම දිවි තොර කරගැනීමකට තැත් කිරීම සම්බන්ධ පුවත හා හදිසි උපකාරක අංක පළ කළේ නම්, ඒ ඔස්සේ දිවි තොර කරගැනීමට නැඹුරුවක් ඇති තවත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩක් ලැබෙනු ඇත.

ඉහත දිවි තොර කරගැනීමේ සිදුවීම, මෙම පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ එදින වාර්තා වී නොතිබුණි. මෙම දිවි තොර කරගැනීම් වාර්තා කර ඇති ආකාරය පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf... https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #Dinamina**